කොවිඩ්- 19 හදිසි ප්‍රතිචාර සහ සෞඛ්‍ය පද්ධති සූදානම් කිරීමේ ව්‍යාපෘතිය - 2020

කොවිඩ්- 19 හදිසි ප්‍රතිචාර සහ සෞඛ්‍ය පද්ධති සූදානම් කිරීමේ ව්‍යාපෘතියේ 2020 අප්‍රේල් 04 දින සිට 2020 දෙසැම්බර් 31 දින දක්වා වූ පළමු ගිණුම් කාලපරිච්ඡේදය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2020 අප්‍රේල් 02 දිනැති අංක පීඒඩී 3852 දරන ලෝක බැංකු වාර්තාවේ 52 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් හා කාලසීමාව

ව්‍යාපෘතියේ ණය ගිවිසුම්වලට අනුව, සෞඛ්‍ය අමාත්‍යාංශය මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර ව්‍යාපෘති කළමනාකරණ ඒකකය (ව්‍යා.ක.ඒ.) මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. කොවිඩ්- 19 හේතුවෙන් ඇති වූ තර්ජනය වැළැක්වීම, හඳුනාගැනීම සහ ඒ සඳහා ප්‍රතිචාර දැක්වීම සහ ශ්‍රී ලංකාවේ මහජන සෞඛ්‍යය සූදානම සඳහා ජාතික පද්ධති ශක්තිමත් කිරීම මෙම ව්‍යාපෘතියේ අරමුණු වේ. ණය ගිවිසුම් අනුව, මෙම ව්‍යාපෘතියේ මුළු ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 25,655.7 කට සමාන එක්සත් ජනපද ඩොලර් මිලියන 128.6 ක් වූ අතර ඉන් රු.මිලියන 18,673.2 කට සමාන එක්සත් ජනපද ඩොලර් මිලියන 93.6 ක් ජාත්‍යන්තර සංවර්ධන සංගමය මගින් මූල්‍යයනය කිරීම සඳහා එකඟවී තිබුණ අතර රු.මිලියන 6,982.5 කට සමාන එක්සත් ජනපද ඩොලර් මිලියන 35 ක ඉතිරි මුදල ප්‍රතිසංස්කරණ හා සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර බැංකුව මගින් මූල්‍යයනය කිරීමට එකඟ වී තිබුණි. මෙම ව්‍යාපෘතියේ කටයුතු 2020 අප්‍රේල් 04 දින ආරම්භ කර තිබුණු අතර 2023 දෙසැම්බර් 31 දින වන විට නිම කිරීමට සැලසුම්කර තිබුණි.

## 1.3 තත්ත්වාගණනය කළ මතය

මාගේ වාර්තාවේ 02 වගුවෙන් විස්තර කර ඇති කරුණුවල බලපෑම හැර, 2020 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ මූල්‍ය තත්ත්වය, ලැබීම් හා ගෙවීම් ගිණුම හා එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විසින් විගණනය සිදුකරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටස් තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදි. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළ දී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳව අදහස් දැක්වීම

### 2.1 ගිණුම්කරණ අඩුපාඩු

| ගිණුම්කරණ අඩුපාඩු | වටිනාකම රු.මිලියන | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) UNICEF ආයතනය විසින් සැපයීමට එකඟ වූ වෛද්‍ය සැපයුම්වලට අදාළ සත්‍ය පිරිවැය නිශ්චය නොකර ඇස්තමේන්තුගත පිරිවැය සත්‍ය පිරිවැය ලෙස සලකා ගිණුම්ගත | 5, 550.40 | නිරීක්ෂණය සමඟ එකඟ වන බව. | භාණ්ඩ ලැබුණු බව තහවුරු කර ගනිමින් පිරිවැය ගිණුම්ගත කළ යුතු අතර, මෙම පිරිවැය තහවුරු කරන ලිඛිත සාක්ෂි විගණනයට |

| | | | | |
|---|---|---|---|---|
| | කර තිබුණි. තවද, මෙම වෛද්‍ය සැපයුම් ලැබීම් සහ නිකුත්කිරීම් තහවුරු කිරීම සඳහා වන සාක්ෂි විගණනය සඳහා ඉදිරිපත්කර නොතිබුණි. | | | ඉදිරිපත් කළ යුතුය. |
| (ආ) | අතීත වියදම් වෙනුවෙන් දරන ලද වියදම් අදාළ වැය ලෙජරයට හර කර නොතිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, මූල්‍ය ප්‍රකාශනවල සහ වැය ලෙජරයේ වියදම් අතර වෙනසක් නිරීක්ෂණය විය. මෙම වියදම්වලට අදාළ ගෙවීම් වවුචර විගණනය සඳහා ඉදිරිපත් නොකළ බැවින් මෙම වියදම්වල නිරවද්‍යතාවය විගණනයේදී පරීක්ෂා කළ නොහැකි විය. | 270.85 | නිරීක්ෂණය සමඟ එකඟ වන බව. | වියදම් අදාළ වැය ශීර්ෂය යටතේ ගිණුම්ගත කළ යුතු අතර මෙම වියදම් සනාථ කරමින් ලිඛිත සාක්ෂි විගණනයට ඉදිරිපත් කළ යුතුය. |
| (ඇ) | වාහන රක්ෂණයට අදාළ පුනරාවර්තන වියදම ප්‍රාග්ධනගතකර තිබුණි. | 2.58 | නිරීක්ෂණය සමඟ එකඟ වන බව. | ඉදිරි වසර සඳහා සකස් කරන මූල්‍ය ප්‍රකාශනවල මෙම දෝෂය නිවැරදි කළ යුතුය. |
| (ඈ) | විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ වාර්තාවට අනුව, මෙම ව්‍යාපෘතිය සඳහා රු.මිලියන 4,224 කට සමාන එක්සත් ජනපද ඩොලර් මිලියන 22 ක අත්තිකාරමක් ලැබී තිබුණි. නමුත්, එය විශේෂ (ඩොලර්) ගිණුමේ රු.මිලියන 4.09 ක් ලෙස දැක්විණි. වෙනස සසඳා නොතිබුණි. | 125.69 | නිරීක්ෂණය සමඟ එකඟ වන බව. | -එම- |
| (ඉ) | විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ වාර්තාවලට අනුව, 2020 ජනවාරි සිට අප්‍රේල් දක්වා රු.මිලියන 270.78 ට සමාන ඇමරිකානු ඩොලර් මිලියන 1.46 ක් ප්‍රතිපූරණය කර තිබුණු අතර මූල්‍ය ප්‍රකාශනවලට අනුව ප්‍රතිපූරණය කළ මුදල රු.මිලියන 270.85 ක් ලෙස දැක්විණි. මෙම වෙනසට හේතු හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | 0.076 | නිරීක්ෂණය සමඟ එකඟ වන බව. | -එම- |
| (ඊ) | සමාලෝචිත කාලපරිච්ඡේදය තුළ අවස්ථා 33 කදී සිදු කරන ලද | 42.40 | නිරීක්ෂණය සමඟ එකඟ වන බව. | මෙම පිරිවැය සනාථ කරන ලිඛිත සාක්ෂි |

| | | | | |
|---|---|---|---|---|
| | ගෙවීම් සඳහා අදාළ ලබන්නාගෙන් මුදල් භාරගත් බවට කුවිතාන්සි ලබාගෙන නොතිබුණු අතර සමාලෝචිත කාලපරිච්ඡේදය තුළ අවස්ථා 56 කදී රෝහල් 7කට ප්‍රේෂණය කරන ලද රඳවා ගැනීමේ මුදල් හා රජයේ ආදායම් භාරගත් බවට කුවිතාන්සි ලබාගෙන නොතිබුණි. | | | විගණනයට ඉදිරිපත් කළ යුතුය. |
| (උ) | සමාලෝචිත කාලපරිච්ඡේදය සඳහා වූ විදේශ විනිමය අලාභය ශුද්ධ වත්කම් යටතේ වෙනමම නොපෙන්වා ජංගම වත්කමක් ලෙස ගිණුම්ගත කර තිබිණි. | 2.28 | නිරීක්ෂණය සමඟ එකඟ වන බව. | ඉදිරි වසර සඳහා සකස් කරන මූල්‍ය ප්‍රකාශනවල මෙම දෝෂය නිවැරදි කළ යුතුය. |
| (ඌ) | 2020 දෙසැම්බර් 31 දිනට ඉතිරි තොග පිළිබඳව නොසලකා ශ්‍රී ලංකා යුද හමුදාව විසින් මිලදී ගන්නා ලද උපකරණවල වටිනාකම සමාලෝචිත කාලපරිච්ඡේදයේ වියදමක් ලෙස ගිණුම්ගත කර තිබිණි. | 188.74 | නිරීක්ෂණය සමඟ එකඟ නොවන බව. මෙම ඉතිරි ද්‍රව්‍ය ඉදිරියේදී නිරෝධායන මධ්‍යස්ථානවල සහ අතරමැදි සත්කාර මධ්‍යස්ථානවල සුමට ක්‍රියාකාරීත්වයක් ලබාදීම සඳහා යොදා ගන්නා බව. | කාලපරිච්ඡේදයට අදාළ වියදම් පැහැදිලිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (එ) | නිදහස් රොබෝ චුම්බක පබළු මත පදනම් වූ RNA යන්ත්‍ර 03ක වටිනාකම තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කර තිබේද යන්න තහවුරු කර නොතිබුණි. | - | නිරීක්ෂණය සමඟ එකඟ නොවන බව. නිදහස් රොබෝ චුම්බක පබළු මත පදනම් වූ RNA යන්ත්‍ර 03 න් එකක් වෛද්‍ය පර්යේෂණ ආයතනය තුළ භාවිතා වේ. අනෙක් යන්ත්‍ර දෙක රත්නපුර ශික්ෂණ රෝහලට සහ මහනුවර ජාතික රෝහලට යවා ඇත. | මෙම යන්ත්‍රවල වටිනාකම තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවල ගිණුම්ගත කළ යුතුය. |

**2.2 නීති රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

| නීති රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ 20 (1) වගන්තිය සහ දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද 2019 ජූලි 09 දිනැති අංක CGRI / 2019 / 03-01 (in & cir) දරන ලිපිය | විධිමත් බදු ඉන්වොයිසියක් නොමැතිව අවස්ථා 27 කදී රු.මිලියන 3.390 ක එකතු කළ අගය මත බදු ගෙවා තිබුණි. | නිරීක්ෂණය සමඟ එකඟ වන බව. සැපයුම්කරුවන් එකතු කළ අගය මත බදු අංකය සහිත බදු ඉන්වොයිස් ඉදිරිපත් කළ බැවින් මේවා ගෙවා ඇති බව. | විධිමත් බදු ඉන්වොයිසිය මත එකතු කළ අගය මත බදු ගෙවිය යුතු අතර පනතට අනුව අදාළ තොරතුරු සැපයිය යුතුය. |

**3. භෞතික කාර්ය සාධනය.**

**3.1 පද්ධති සහ පාලනයන්**

| විගණන නිරීක්ෂණය | | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශයන් |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත කාලපරිච්ඡේදය තුළ රු.මිලියන 27.19 ක වියදමින් මිලදී ගෙන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාල තුනකට නිකුත් කරන ලද ද්විත්ව කාර්යය කැබ් රථ තුනක් 2021 සැප්තැම්බර් 28 දින වන විටත් එම කාර්යාල වෙත භාරදී නොතිබුණි. | නිරීක්ෂණය සමඟ එකඟ නොවන බව. ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්ගේ රාජකාරි කටයුතු සඳහා යොදාගත් ද්විත්ව කාර්යය කැබ් රථ 4 අදාළ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන්ගේ කාර්යාල වෙත යැවීමට අවශ්‍ය කටයුතු කළ බව. | මෙම වාහන 03 කඩිනමින් නියමිත කාර්යාල වෙත ලබා දිය යුතුය. |
| (ආ) | මෙම ව්‍යාපෘතිය මගින් රු.මිලියන 239.48 ක පිරිවැයක් දරමින් යතුරුපැදි 805 ක් මිලදී ගෙන මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් වෙත නිකුත් කර තිබුණි. කෙසේ වෙතත්, අදාළ නිලධාරීන් සහ අමාත්‍යාංශය අතර ලිඛිත ගිවිසුමකට එළඹුණු බව තහවුරු නොකෙරුණි. | නිරීක්ෂණය සමඟ එකඟ නොවන බව. | දෙපාර්ශවය අතර ගිවිසුම් ඇති කර ගත යුතුය. |
| (ඇ) | වැලිකන්ද කොවිඩ් 19 ප්‍රතිකාර මධ්‍යස්ථානය ඉදිකිරීමට අවශ්‍ය ගොඩනැගිලි ද්‍රව්‍ය හා උපකරණ මිලදී ගැනීම සඳහා ව්‍යාපෘතිය විසින් රු.මිලියන 12.79 ක් ගෙවා තිබුණද, මෙම සියලු ද්‍රව්‍ය ඉදිකිරීම් සඳහා යොදා ගන්නා ලද බවට සහ අපේක්ෂිත ප්‍රමිතියට අනුව ඉදිකිරීම් අවසන් කර තිබුණු බව තහවුරු නොකෙරුණි. | නිරීක්ෂණයට එකඟ නොවන බව. වැලිකන්ද කොවිඩ් 19 ප්‍රතිකාර මධ්‍යස්ථානය ඉදිකිරීම සඳහා මිලදී ගත් සියලුම ද්‍රව්‍ය සහ උපකරණ සහ අනෙකුත් පරිභෝජන ද්‍රව්‍ය ඉදිකිරීම් සඳහා යොදා ගන්නා ලද බව. | මිලදී ගත් සියලුම ද්‍රව්‍ය ඉදිකිරීම් සඳහා යොදාගෙන අපේක්ෂිත ප්‍රමිතියට ඉදිකිරීම් කර ඇති බවට ඉංජිනේරු සහතිකයක් ලබා ගත යුතුය. |
| (ඈ) | මෙම ව්‍යාපෘතිය මගින් අම්පාර දිස්ත්‍රික්කයේ ස්ථාපිත කර ඇති නිවාස යෝජනා ක්‍රමයක් සඳහා විදුලිය ලබාගැනීම සඳහා රු.මිලියන 5.45 ක්ද, ජලය ලබාගැනීම සඳහා රුපියල් මිලියන 4.5 ක්ද ගෙවා තිබුණි. කෙසේ වෙතත්, නියමිත කාලය තුළ වැඩ නිම කළ බව තහවුරු කෙරෙන ලිඛිත සාක්ෂි ඉදිරිපත් නොකෙරුණි. | මෙම කටයුතුවලට අදාළ ගනුදෙනු සම්බන්ධයෙන් අවශ්‍ය ලියකියවිලි සහ සාක්ෂි ලබාගැනීමට කටයුතු කර ඇති බව. | මෙම තොරතුරු විගණනයට ඉදිරිපත් කළ යුතුය. |